**ජනාධිපතිවරයාගේ අරමුදල - 2016**

**-------------------------------------------**

ජනාධිපතිවරයාගේ අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 7 දරන ජනාධිපතිවරයාගේ අරමුදල් පනතේ 9(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. අරමුදල් පනතේ 10 වගන්තිය ප්‍රකාරව මුදල් අමාත්‍යතුමා වෙත ඉදිරිපත් කළ යුතු එකී පනතේ 9(4) වගන්තියෙහි සඳහන් අරමුදලේ ආදායම හා වියදම පිළිබඳ සහ අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශය ඇමුණුම 01 ලෙසද ඇතුළත් කර, අරමුදලේ කටයුතු පරිපාලනය කිරීම පිළිබඳ වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. ජනාධිපතිවරයාගේ අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විස්තරාත්මක වාර්තාවක් ජනාධිපති ලේකම් වෙත 2017 ජූලි 31 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන
----------------

### 2.1 මතය
------

මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ජනාධිපතිවරයාගේ අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 3. මූල්‍ය සමාලෝචනය
---------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල
-------------


ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.මිලියන 183.81 ක ඌනතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 159.12 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 342.93 ක පිරිහීමක් දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ අරමුදලේ ආදායම රු.මිලියන 72.88 කින් වැඩිවී තිබුණද, වෛද්‍යාධාර වියදම් රු.මිලියන 387.94 කින් හා ශිෂ්‍යත්ව ප්‍රදානයන් රු.මිලියන 38.01 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ තුන සඳහා අරමුදලේ ආදායමේ අතිරික්තය/ (ඌනතාවය) සහ ශුද්ධ වත්කම් තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | ආදායමේ අතිරික්තය/ (ඌනතාවය) | දෙසැම්බර් 31 දිනට ශුද්ධ වත්කම් තත්ත්වය |
|---|---|---|
| | රු. මිලියන | රු. මිලියන |
| 2013 | 531 | 2,215 |
| 2014 | 475 | 2,674 |
| 2015 | 159 | 2,499 |
| 2016 | (184) | 2,296 |




ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 වර්ෂයේ අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් රු.මිලියන 531 ක ශුද්ධ අතිරික්තයක් ලබා තිබූ අතර, එය 2016 වර්ෂය අවසාන වනවිට රු.මිලියන 184 ක ශුද්ධ ඌනතාවයක් දක්වා අඛණ්ඩව පිරිහී තිබුණි. ඊට අනුරූපීව, අරමුදලේ ශුද්ධ වත්කම් තත්ත්වයද 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අඛණ්ඩව බාදනය වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ මුළු ආදායමෙන් සියයට 87.6 ක්වූ රු.මිලියන 1,771.1 ක් සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබී තිබුණු අතර, ඉකුත් වර්ෂයේදී එම මණ්ඩලයෙන් ලද රු.මිලියන 1,727.06 ක ආදායම සමග සැසඳීමේදී එය රු.මිලියන 44.04 කින් වැඩිවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යසාධනය

----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් වෛද්‍යාධාර, සංස්කෘතික කටයුතු, ආගමික කටයුතු, සුභසාධන කටයුතු, අධ්‍යාපනික කටයුතු, ක්‍රීඩා හා කලා කටයුතු සහ දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා රු.මිලියන 1,438.1 ක මුදලක් වැය කර තිබුණි. එම මුළු වියදමේ සංයුතිය වෛද්‍යාධාර සඳහා සියයට 89.59 ක්ද, සංස්කෘතික කටයුතු සඳහා සියයට 0.26 ක්ද, ආගමික කටයුතු සඳහා සියයට 0.34 ක්ද, සුභසාධන කටයුතු සඳහා සියයට 0.66 ක්ද, අධ්‍යාපනික කටයුතු සඳහා සියයට 0.16 ක්ද, ක්‍රීඩා හා කලා කටයුතු සඳහා සියයට 0.20 ක්ද, දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව සඳහා සියයට 8.79 ක්ද ලෙස විය.

(ආ) වෛද්‍යාධාර, අධ්‍යාපන කටයුතු, ආගමික කටයුතු, සුභසාධන කටයුතු, ක්‍රීඩා හා කලා කටයුතු සහ දේශීය හා විදේශීය ශිෂ්‍යත්ව ප්‍රදානය වෙනුවෙන් දරන ලද වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිළිවෙලින් සියයට 43 කින්, සියයට 114 කින්, සියයට 37 කින්, සියයට 13 කින්, සියයට 86 කින් සහ සියයට 43 කින් වර්ධනය වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් වෛද්‍යාධාර ගෙවීම සඳහා රු.1,288,493,432 ක් වැය කර තිබුණ අතර, ඉන් මහජන නියෝජිතයන් ලෙස තේරී පත්ව සිටින සහ එලෙස සිටි පුද්ගලයන් 07 දෙනෙකු වෙනුවෙන් රු.14,390,000 ක්ද, අනෙකුත් සියලු පාර්ශවයන් එනම්, මහජනතාව වෙත වෛද්‍යාධාර අවශ්‍යතා 8,388 ක් වෙනුවෙන් රු.1,274,103,432 ක්ද වැයකර තිබුණි. කෙසේ වුවද,

මහජනතාව වෙත වෛද්‍යාධාර අවශ්‍යතා වෙනුවෙන් වැයකළ ප්‍රමාණය අරමුදලේ මුළු වෛද්‍යාධාර වියදමින් සියයට 98.9 ක් නියෝජනය විය.

(ඈ) අරමුදලේ ප්‍රතිපත්තිය අනුව විවෘත හෘද සැත්කමක් සඳහා රු.200,000 ක්ද, විවෘත නොවන හෘද සැත්කමක් සඳහා රු.150,000 ක්ද ගෙවිය හැකි වුවද, එම කාර්යයන් සඳහා මහජන නියෝජිතයන් හෝ එලෙස සිටි පුද්ගලයන්ට මෙන්ම එසේ නොවන සාමාන්‍ය තැනැත්තන්ටද එම සීමාවන් ඉක්මවා වෛද්‍යාධාර ගෙවා තිබූ අවස්ථා නිරීක්ෂණය විය. පූර්ව වර්ෂ වලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද සාමාන්‍ය තැනැත්තකු වෙත ගෙවන ලද වෛද්‍යාධාරවල සාමාන්‍ය වටිනාකමට සාපේක්ෂව වඩා වැඩි සාමාන්‍ය වටිනාකමකින් යුතුව මහජන නියෝජිතයෙක් හෝ එලෙස සිටි පුද්ගලයෙකු වෙනුවෙන් වෛද්‍යාධාර ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) ඉහත 3.2 හි දැක්වෙන අයහපත් මූල්‍ය තත්ත්වය පිළිබඳව අවධානය යොමු කිරීමේදී, නියමිත සීමාවන් ඉක්මවා කවර පාර්ශවයකට හෝ වෛද්‍යාධාර ලබාදෙන්නේ නම් එහිදී අදාළ කරගත යුතු සාධාරණීකරණය කලහැකි නිශ්චිත නිර්ණායක හඳුන්වා දීම මගින් අරමුදලේ වියදම් මනාව කළමනාකරණය කර ගැනීම උචිත බව නිරීක්ෂණය විය.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී හෘද සැත්කම් 5,897 ක් සඳහා රු.මිලියන 891.9 ක්ද, පිළිකා ප්‍රතිකාර කිරීම් 635 ක් සඳහා රු.මිලියන 81.5 ක්ද, වකුගඩු බද්ධ කිරීම් 724 ක් සඳහා රු.මිලියන 116.6 ක්ද, වෙනත් ප්‍රතිකාර කිරීම් 1,139 ක් සඳහා රු.මිලියන 198.5 ක්ද වෛද්‍යාධාර වශයෙන් වැය කර තිබුණි. ඉකුත් වර්ෂයේදී රෝගීන් 6,050 ක් සඳහා රු.මිලියන 900.6 ක මුදලක් වැය කිරීම සමඟ එය සැසඳීමේදී මෙම වර්ෂයේදී වෛද්‍යාධාර ලැබූ රෝගීන් ප්‍රමාණය 2,345 කින්, එනම් සියයට 39 කින්ද, වෛද්‍යාධාර වියදම රු.මිලියන 387.9 කින්ද වැඩිවී තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේදී අරමුදල විසින් රු.මිලියන 1,659.14 ක මුදලක් ආයෝජනය කර තිබූ අතර රු. මිලියන 1,622.35 ක ආයෝජන ආපසු ලබාගෙන තිබුණි. ඒ අනුව, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අරමුදල සතුව පැවති ආයෝජන ශේෂයෙහි රු. මිලියන 36.8 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. එසේම, ඉකුත් වර්ෂයට සාපේක්ෂව අරමුදලේ පොලී ආදායමද රු. මිලියන 9.84 කින් වර්ධනය වී තිබුණි.

(ඌ) මහනුවර ප්‍රදේශයේ රු.මිලියන 80 ක වියදමින් ඉදිකරනු ලබන පිළිකා රෝහල සඳහා විශේෂ ව්‍යාපෘති වියදම් ලෙස රු. මිලියන 20 බැගින් 2014 සහ 2015 වර්ෂ වලදී අරමුදලින් මුදල් ලබා දී තිබුණද, සමාලෝචිත වර්ෂයේ එම වියදම දරා නොතිබීම හේතුවෙන් විශේෂ ව්‍යාපෘති ලෙස කිසිදු වියදමක් නොවීය.

## 4.2 කාර්ය මණ්ඩල පරිපාලනය

2016 දෙසැම්බර් 31 දිනට ජනාධිපති ලේකම් කාර්යාලයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අතිරේක ලේකම්වරයෙකු, ගණකාධිකාරීවරයෙකු ඇතුළු නිලධාරීන් 37 දෙනෙක් අරමුදලේ සේවය වෙනුවෙන් නිදහස් කර තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 5.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැයගත ආදායම් හා වියදම්, සත්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදී සියයට 10 සිට සියයට 80 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛණය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන දුර්වලතාවයන් වරින් වර අරමුදලේ ලේකම්වරයාගේ අවධානයට යොමු කරන ලදී.

**ඇමුණුම 01**

**අරමුදලේ ආදායම හා වියදම පිළිබඳ සහ අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම පිළිබඳ ප්‍රකාශය**

(i). විගණනයට ඉදිරිපත් කරන ලද මුලා ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ අරමුදලේ ආදායම් හා වියදම් ඉකුත් වර්ෂය සමග සසඳා පහත දක්වා ඇත.

| **විස්තරය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා** | |
|---|---|---|
| | **2016** | **2015** |
| | රු. | රු. |
| **ආදායම** | | |
| දායකයන් ලැබීම | 63,010,454 | 44,006,333 |
| පොලී ආදායම | 187,773,079 | 177,936,245 |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබීම | 1,771,101,046 | 1,727,063,739 |
| | **2,021,884,579** | **1,949,006,317** |
| **වියදම** | | |
| විගණන ගාස්තු | 170,000 | 160,000 |
| වෛද්‍යාධාර | 1,288,493,432 | 900,556,662 |
| සංස්කෘතික කටයුතු | 3,800,000 | 2,750,000 |
| ආගමික කටයුතු | 5,012,500 | 3,650,000 |
| සුභසාධන කටයුතු | 9,632,000 | 8,557,477 |
| අධ්‍යාපන කටයුතු | 2,350,000 | 1,100,000 |
| ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය | 125,867,470 | 87,853,050 |
| විශේෂ ව්‍යාපෘති (මහනුවර පිළිකා රෝහල) | - | 20,000,000 |
| ක්‍රීඩා හා කලා කටයුතු | 2,974,500 | 1,600,000 |
| මහපොල උසස් අධ්‍යාපන භාරකාර අරමුදලට 50% ක දායකත්වය | 767,393,833 | 735,754,720 |
| ලැබිය යුතු පොලී කපාහැරීම | - | 27,900,000 |
| | **2,205,693,735** | **1,789,881,909** |
| ආදායමේ අතිරික්තය/ (ඌනතාවය) | **(183,809,156)** | **159,124,408** |

(ii) විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනට අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත සඳහන් වගුවෙන් දැක්වේ.

| **ආයෝජන වර්ගය** | **2016 ජනවාරි 01 දිනට ශේෂය** | **2016 වර්ෂය තුළ** | | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|---|---|---|
| | | **ආයෝජනය කිරීම්** | **ආයෝජන නිදහස් කිරීම්** | |
| | රු. | රු. | රු. | රු. |
| ජාතික ඉතිරි කිරීමේ බැංකුව - ස්ථාවර තැන්පත් | 1,622,567,500 | 1,470,074,000 | 1.622,347,500 | 1,470,294,000 |
| මහජන බැංකුව - ස්ථාවර තැන්පත් | 112,780,000 | 8,012,341 | - | 120,792,341 |
| සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආයෝජන | 2,200,000 | - | - | 2,200,000 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 338,790,000 | - | - | 338,790,000 |
| ප්‍රති මිලදී ගැණුම් ගිවිසුම් | - | 181,050,000 | - | 181,050,000 |
| | **2,076,337,500** | **1,659,136,341** | **1,622,347,500** | **2,113,126,341** |